*සැ. යු.*- 2016.03.04 දින පළවූ අංක 1957 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,958 - 2016 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2016.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 396 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 402 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 01 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2016 මාර්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ‍ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය

**නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :-*

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම/ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) වෙනත් :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී හෝ අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.
- මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව සහ ඉංග්‍රීසි භාෂාවෙන් අධිකරණ කටයුතු කිරීමේ හැකියාව තිබීම.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරි III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව :*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790- 17 x 1,050 - රු. 53,555 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006හි අංක SL 1 - 2006 වැටුප් බණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | ***අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*** | | 20 |
| | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | ***සටහන.***-ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10ක් ලබා දිය යුතුයි. | | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02. | ***අතිරේක වෘත්තීය සුදුසුකම් :*** | | 15 |
| | නීතිය පිළිබඳ ආචාර්ය උපාධිය | 15 | |
| | නීතිය පිළිබඳ වසරකට නොඅඩු පශ්චාත් උපාධිය | 10 | |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින් - උපරිම ලකුණු 15)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) - උපරිම ලකුණු 15<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින් - උපරිම ලකුණු 10). | | |
| 03. | *අතිරේක පළපුරුද්ද :*<br><br>නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක් (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර).<br><br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | | 30 |
| 04. | *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :*<br><br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය).<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>-මාස 06/පැය 720<br>-මාස 03/පැය 360<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | 15<br><br><br><br><br>10<br><br><br><br><br><br><br>07<br>05 | 15 |
| 05. | *තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :*<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා<br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500ක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>-මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | 15<br><br>10<br><br><br>07<br>05 | 15 |
| 06. | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව :** | | 05 |
| | **මුළු එකතුව** | | 100 |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(අ) අයදුම්පත් 2016.04.11 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය,
40, බුත්ගමුව පාර,
රාජගිරිය.

(ආ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඇ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සමාදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

වී. බී. පර්ල් කේ. වීරසිංහ,
ලේකම්,
ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය,
රාජගිරිය.

### ආදර්ශ අයදුම් පත්‍රය

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

01. 1.1 මුලකුරු සමග නම : Mr./Mrs./Miss ————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.2 සම්පූර්ණ නම : මයා./මිය./මෙය. :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

03. දුරකථන අංකය :
ස්ථාවර :————. ජංගම :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

05. 5.1 උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

5.2 2016.04.11 දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

6.0 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

6.1 නීති උපාධිය පිළිබඳ විස්තර :

(i) උපාධිය බලපැවැත්වෙන දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(iii) භාෂා මාධ්‍යය :————.

*නැතහොත්,*

(iv) ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

6.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී හෝ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට ඇති සාමාර්ථය :————.

7.0 ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද : (වසර ගණන) :————.

8.0 යම්කිසි සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලබා තිබේ ද? එසේ නම් දිනය හා නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සපයන්න. :————.

09. අයදුම්කරුගේ සහතිකය :

..................... වන මම මෙහි සඳහන් කරන ලද සියළුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත්, සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................ (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

(රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 22,935කට නොඅඩු මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.)

11. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............... (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියෙකු වශයෙන් සේවයේ නියුතු බවත් .................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

03-351

---

**අධිකරණ අමාත්‍යාංශය**

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ (හදිසි) මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

මෙහි පහත උපලේඛනයේ දක්වෙන ප්‍රදේශවල පුරප්පාඩුවී ඇති හදිසි මරණ පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර ''ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12'' වෙත 2016.03.31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ''(හදිසි) මරණ පරීක්ෂක තනතුර - පේරාදෙණිය මහ රෝහල'' යනුවෙන් සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවේ. මෙම තනතුරට පත් කරනු ලබන දින සිට වසර පහකට බලපවත්වන පරිදි පත් කරනු ලබන අතර, ඉන්පසුව අදාළ ප්‍රදේශයේ මහෙස්ත්‍රාත්තුමාගේ හා පොලිස් ස්ථානාධිපතිගේ නිර්දේශයන් සහ වෛද්‍ය නිර්දේශ සලකා බලා සේවය දීර්ඝ කරනු ලැබිය හැකිය. එම තනතුර දැරීමේ උපරිම වයස් සීමාව අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. එහෙත් ඉන් පෙර ඕනෑම අවස්ථාවක (හදිසි) මරණ පරීක්ෂකවරයෙකු හේතු දක්වා අමාත්‍යවරයා විසින් සේවයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. පත්වීම් දෙනු ලබන පුරප්පාඩු වී ඇති (හදිසි) මරණ පරීක්ෂක කොට්ඨාස පහත සඳහන් උපලේඛනයේ සඳහන් වේ.

04. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව (හදිසි) මරණ පරීක්ෂකවරුන්ගේ කාර්යයන් පත්වීම්ලාභීන් විසින් ඉටු කළ යුතු වේ.

05. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එසේ වුව ද මරණ පරීක්ෂණයක් සඳහා රු. 500 ක ගාස්තුවක් ද, මරණ පරීක්ෂකවරුන් සඳහා අනුමත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ද ගෙවනු ලැබේ.

06. පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති අයවලුන්ට පමණක් අයදුම් කල හැක.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ආ) පත්වීම් අපේක්ෂා කරන ප්‍රදේශයේ පසුගිය වසර දෙක තුළ ස්ථිර පදිංචිකරුවකුව සිටීම.

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය.

(ඈ) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී විෂයයන් 03කින් සාමාර්ථය ලබා තිබීම.
(මෙහිදී විද්‍යා විෂයයන්ගෙන් සාමාර්ථය ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

(ඉ) හදිසි මරණ පරීක්ෂණ තනතුර (මුස්ලිම්) සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්ට දෙමළ භාෂාවෙන් කතා කිරීමේ හා ලිවීමේ හැකියාව තිබිය යුතු ය.

(ඊ) මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයෙකු විය යුතු ය. මත්පැන් පාවිච්චියෙන් සහ දුම්පානයෙන් තොර තැනැත්තන් සඳහා ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.

07. අයදුම්පත් භාරගන්නා අවසන් දින වනවිට රජයේ, පළාත් සභා අරමුදලකින් හෝ පළාත් පාලන ආයතනයක අරමුදලකින් වැටුපක් හෝ දීමනාවක් ලබන තැනැත්තන් ද, රාජ්‍ය සංස්ථාවල සහ සමුපකාර සමිතිවල සේවකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ද, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් ද, පළාත් සභා මන්ත්‍රීවරුන් හෝ පළාත් පාලන ආයතනවල සභිකයන් ද මෙම තනතුර සඳහා අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

08. ඉල්ලුම්පත්‍රය සමඟ කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතු ය. එසේ වුව ද සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් සියලුම සුදුසුකම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර, පහත දක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) ජාතික හැඳුනුම්පත;
(ඈ) ස්ථිර පදිංචිය සනාථ කෙරෙන ග්‍රාම නිලධාරී සහතිකය;
(ඉ) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
(ඊ) අතිරේක සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඇති වෙනත් සහතික තිබේ නම් එම සහතික;
(උ) විශ්‍රාමික අයදුම්කරුවන් විසින් විශ්‍රාම ගත් දිනය සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි.

09. සියලුම අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතියට අනුකූලව පැහැදිලි අකුරින් සම්පූර්ණ කර තිබිය යුතු ය. අවශ්‍ය තොරතුරු සියල්ල ඇතුළත් නොකර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ඉල්ලුම්පත් ආකෘති පිරවීමේ දී යෝග්‍යතා නිර්ණායක පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් කළ යුතු ය. ඉහත 07 වන ඡේදයේ සඳහන් ගණයකට අයත් හෝ අංක 06 හෝ 08 යන ඡේද සඳහා අසත්‍ය තොරතුරු සපයන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගෙන පත්වීම් දීමෙන් අනතුරුව සත්‍ය තත්වය ඔප්පු වුවහොත් එබඳු අයදුම්කරුවන්ගේ පත්වීම් වහාම අවලංගු කරනු ලැබේ.

11. තව ද, හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් පත්කරනු ලැබීමෙන් පසුව ඉහත 07 ඡේදයේ තනතුරකට පත්වුවහොත් එසේ පත්වීම ලද දින සිට මෙකී පත්වීම අහෝසි වේ.

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

**හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය**

| | | | |
|---|---|---|---|
| *දිස්ත්‍රික්කය* | | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | |
| අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය | | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | |
| අදාළ පොලිස් ස්ථානය | | පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය | |

01. (අ) මුලකුරු සමඟ නම (පැහැදිලි අකුරෙන්) :————.
(පෙලපත් නාමය යටින් ඉරක් අඳින්න.)
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. ලිපිනය :————.

03. දුරකථන අංකය :————.

04. හැඳුනුම්පත් අංකය :————.

05. උපන් දිනය :————.

06. 2016.03.31 දිනට වයස : අවු. :————. මාස :————. දින :————.

07. ස්ත්‍රී/පුරුෂභාවය :————.

08. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* | *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(i) අ. පො. ස. (උ. පෙළ) විභාගය :

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* | *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් :—————.

10. වර්තමාන රැකියාව :—————.

11. කලින් කරන ලද රැකියාව :—————.

12. (*අ*) රජයේ/රාජ්‍ය සංස්ථාවක/පළාත් සභාවක, සමුපකාර හෝ පළාත් පාලන ආයතනයක රැකියාවක් කරන්නේ ද ? :—————.

(*ආ*) එවැනි සේවයකින් අස්වී/විශ්‍රාම ගොස් ඇත්නම්, අස්වීමට/විශ්‍රාම යාමට හේතුව :—————.

(*ඇ*) අස්වීම/විශ්‍රාම යාම අනුමත කළ දිනය :—————.

13. (*අ*) ඔබට විරුද්ධව කිසියම් කලක සේවා යෝජකයා විසින් විනයානුකූලව කටයුතු කර තිබේ ද? :—————.

(*ආ*) එසේ නම්, චෝදනාවේ ස්වභාවය හා ප්‍රතිඵල :—————.

14. (*අ*) (i) යම්කිසි වරදකට කෙදිනකදී හෝ ඔබට විරුද්ධව උසාවියේ නඩුවක් පවරා තිබුනේ ද?

(ii) ඔබ ද හවුල් වූ ආරවුලක් සමථකරණය කිරීම සඳහා කෙදිනකදී හෝ සමථ මණ්ඩලයකට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුනේ ද?

(*ආ*) එසේ නම් එහි ප්‍රතිඵලය :—————.

15. (*අ*) දැනට (හදිසි) මරණ පරීක්ෂක තනතුරක් දරන්නේ ද ? :—————.

(*ආ*) එසේ නම්, පළමු පත්වීම් ලැබූ දිනය හා අමාත්‍යාංශයේ ගොනු අංකය :—————.

16. මෙම තනතුර සඳහා අදාළ වෙනත් සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :—————.

17. චරිත සහතික දෙන පුද්ගලයන් දෙදෙනාගේ නම්, ලිපිනයන් හා පදවි නාම :————.

(i) ————.

(ii) ————.

ම'විසින් ඉහත සඳහන් කර ඇති කරුණු සියල්ලම සම්පූර්ණයෙන්ම සත්‍ය බව හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

*උපලේඛනය*

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය* |
|---|---|---|
| නුවර කඩවත් සතර හා ගඟවට කෝරළය | පේරාදෙණිය මහ රෝහල | ගැටඹේ 259 |

03-324

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2016 මාර්තු

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර හා මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරක නිලධාරියකු එකී පත්වීම් දින සිට දෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2016.04.10 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරීන් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2016.03.19 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතු ය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ''සුවසිරිපාය'' ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2016.03.24 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. තම අයදුම්පත සමඟ ලිපිනය ලියන ලද රු. 35ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතු ය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිතවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු* : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක්

විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුලත් කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්-පත්‍රය;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය;
(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකිය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිළධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක්ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකිය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතුය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.
(වෙබ් අඩවිය-www. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :

මෙම විභාගය ලිඛිත රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතුය. එක් වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිළධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියළුම විෂයන්ට පෙනී සිටිය යුතුය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07.1 ලිඛිත විභාගය

07.1.1 ආයතන සංග්‍රහය
කාලය පැය 02 යි, ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂය නිර්දේශය :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි,

(iii) ආයතන සංග්‍රහය :

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,

II කොටස — XLVII සහ XLVIII වැනි පරිච්ඡේදයන්.

7.1.2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය :
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂය නිර්දේශය :
සෞඛ්‍ය සේවා සංග්‍රහය -
(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමණාකරණය
(iii) ඖෂධ කළමණාකරණය

07.1.3 ගිණුම් :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය :

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි;
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මුල්‍ය කොටස;
(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මුල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ. 124, 125, 126, 127, 128, 131,133,134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ. 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ. 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ 715, 716, 756, 757, 758 |

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

1 වැනි පරිච්ඡේදය - සියළුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07.2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :
සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ

මාධ්‍යයෙන්ද, දෙමළ මාධ්‍ය නිලධාරීන්ට සිංහල මාධ්‍යයෙන්ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්‍ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/ විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයෙහි නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුලත් කර ඇත.

*සැ. යු.* : විභාග නිවේදනයේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් අතර යම් ව්‍යාකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

එම්. බී. එල්. රහුමාන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

2016 පෙබරවාරි මස 24 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය''
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2016 මාර්තු**

01 (අ) (i) අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන් මුලකුරු අගට යොදා ලියන්න) :————.

(ii) අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් මුලකුරු අගට යොදා ලියන්න) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) (i) නිල නාමය (අදාළ කොටුව තුල ( √ ) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරී ☐ II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී ☐

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ ( √ ) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ☐ ආයතන සංග්‍රහය ☐ ගිණුම් ☐

සිංහල වාචික ☐ දෙමළ වාචික ☐

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදල කොටුවේ ( √ ) හරි ලකුණ යොදන්න.) :

සිංහල ☐ ඉංග්‍රීසි ☐ දෙමළ ☐

04. (අ) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :————.

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට ☐

පළාත් සභාවට ☐

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :—————.

(ඇ) දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

(ඈ) හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාල කොටුවේ ( √ ) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | ☐ | කඳාන | ☐ | හම්බන්තොට | ☐ | අම්පාර | ☐ |
| කළුතර | ☐ | ගාල්ල | ☐ | බදුල්ල | ☐ | වව්නියා | ☐ |
| කුරුණෑගල | ☐ | අනුරාධපුර | ☐ | රත්නපුර | ☐ | පොළොන්නරුව | ☐ |
| මහනුවර | ☐ | මඩකලපුව | ☐ | යාපනය | ☐ | ත්‍රිකුණාමලය | ☐ |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 35 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :—————.

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :—————.
(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :—————.
(ආ) එසේ පෙනී සිට ඇත්නම් මෙවර වෙනුවෙන් මුද්දර අලවා තිබේද? :—————.

මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.)

06. *අයදුම්කරුගේ සහතිකය* :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු.... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

07. *පෞද්ගලික ලිපිගොනු බාර විෂය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය* :

මෙම අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත් මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

————,
නම සහ අත්සන

දිනය :—————.

08. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවටද රු.................. ක් වටිනා මුද්දර මෙම මුද්දර ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

__________,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :_________.

09. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :*

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් මගේ කොට්ඨාසයේ/විශේෂිත ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

__________,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :_________.
(අනවශ්‍ය කොටස් කපා හරින්න)

03-316

---

## විදේශ කටයුතු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ - 2015/2016

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් හා දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ 2016 ජුනි මස කොළඹ දී සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයන් හි දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. වාචික පරීක්ෂණය කොළඹ දී පමණක් පැවැත් වේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකට ම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශය :*

1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවෙහි අන්තර්ගත වී ඇත.

දෙවන භාෂා පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන මීට අමුණා ඇති පරිශිෂ්ටය 'අ' හි ද, 1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම්වලට හා විදේශ භාෂාවලට අදාළ විෂය නිර්දේශ හා විධිවිධාන පරිශිෂ්ටය 'ආ' හි ද දක්වා ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී, ඔවුන්ගේ කැමැත්ත අනුව පෙනී සිටීමට නිලධාරීන්ට අවසර තිබේ. දෙවන භාෂා පරීක්ෂණයට පෙනී සිටින නිලධාරීන් සඳහා වූ වාචික පරීක්ෂණය එකම ස්ථානයක දී එකම වේලාවේ දී පැවැත්වීමට කටයුතු කරනු ඇත.

04. කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

1 වන කාර්යක්ෂමතා කඩඉම

| *විෂයය අංකය* | *විෂයය* | *කාලසීමාව පැය* |
|---|---|---|
| 1 වන කොටස | | |
| 01 | මුදල් | 03 |
| 02 | ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය | 03 |
| II කොටස | | |
| 03 | මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 04 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 05 | ජාත්‍යන්තර කටයුතු | 03 |
| 06 | ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි හා පරිගණක හැකියාව | 03 |

2 වන කාර්යක්ෂමතා කඩඉම

| *විෂයය අංකය* | *විෂයය* | *කාලසීමාව පැය* |
|---|---|---|
| I වන කොටස | | |
| 21 | ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය | 03 |
| 22 | පරිපාලනය<br>(*අ*) කාර්යාලය ක්‍රම හා සංවිධාන ක්‍රම<br>(*ආ*) ආයතන සංග්‍රහය (I හා II වෙළුම) | 03 |

| විෂය අංකය | විෂයය | කාලසීමාව පැය |
|---|---|---|

II වැනි කොටස

| | | |
|---|---|---|
| 23 | මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 24 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 25 | ජාත්‍යන්තර කටයුතු | 03 |

**විදේශ භාෂා**

| විෂය අංකය | විෂයය | කාලසීමාව පැය |
|---|---|---|
| 07 | අරාබි | 02 |
| 08 | ප්‍රංශ | 02 |
| 09 | රුසියානු | 02 |
| 10 | ස්පාඤ්ඤ | 02 |
| 11 | හින්දි | 02 |
| 12 | චීන | 02 |
| 13 | ජර්මන් | 02 |
| 14 | ජපන් | 02 |
| 15 | ඉංග්‍රීසි | 02 |
| 16 | කොරියානු | 02 |

**දෙවන භාෂා**

| විෂය අංකය | විෂයය | කාලසීමාව පැය |
|---|---|---|
| 30 | සිංහල (ලිඛිත) | 02 |
| 31 | දෙමළ (ලිඛිත) | 02 |
| 32 | ඉංග්‍රීසි (ලිඛිත) | 02 |
| 33 | සිංහල (වාචික) | |
| 34 | දෙමළ (වාචික) | |
| 35 | ඉංග්‍රීසි (වාචික) | |

05. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 5 වැනි ඡේදය කෙරෙහි යොමු කරවනු ලැබේ.

"දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළු) -

උසස් කිරීමේ විභාගවලට මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට ද මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළත්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවය. තරග විභාගයක් නොමැතිව මුලින් ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය."

05.1 *ප්‍රතිඵල නිකුත් කිරීම* :

විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනය, 1 වැනි කාර්යක්ෂමතා කඩඉම හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම ලෙස වෙන් වෙන් වශයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත පමණක් ලබාදෙනු ඇත.

06. විදේශ භාෂා හැර අනෙකුත් ප්‍රශ්න පත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂකයින්ට හැකි වනු පිණිස විභාග කොමසාරිස් ජනරාල් කටයුතු කරනු ඇත. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අපේක්ෂකයෙක් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව, ඒ 4 පත්‍රයක සකස්කොට ඉදිරිපත්කළ යුතුය. ඒ 4 පත්‍රයේ දෙපසම පාවිච්චිකළ යුතු අතර, අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 8 දක්වා පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත්වන සේ අයදුම්පත සකස්කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් යෙදිය යුතුය. විභාග දෙකටම පෙනී සිටින අයදුම්කරුවන් ඒ ඒ විභාගය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත්කළ යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

10. සියලුම අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් 2016 අප්‍රේල් මස 12 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්ට යැවීමට හැකිවන පරිදි, විදේශ අමාත්‍යාංශයේ, විදේශ දූතමණ්ඩල පාලන අංශයට එවිය යුතුය. විදේශ දූත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් දූතමණ්ඩල ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතුකළ යුතුය. අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

11.නියමිත පරිදි විභාග ඉල්ලුම්පත්‍ර යොමු කරන ලද සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම්, තම ඉල්ලුම් පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවීම අදාළ ඊට අදාළ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද සහිතව ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන්කොට අදාළ ඉල්ලීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කිරීම වඩාත් ඵලදායී වනු ඇත. (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙහි ෆැක්ස් අංකය -0112784232)

12.ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් පසුව ඉදිරිපත් කරන ලියකියවිලි සළකා බලනු නොලැබේ. (සංශෝධන 5.2 අනුව යොදන්න)

13.විභාග මධ්‍යස්ථානයේ දී අනන්‍යතාව සනාථ කරනු සඳහා පිළිගනු ලබන ලියවිලි මෙසේය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. පළමුවන වතාවට මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාග ගාස්තුවලින් නිදහස්වන අතර, ඉන්පසුව පෙනී සිටින අවස්ථාවල දී පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුය.

(අ) පළමුවන වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක්) සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා

| | රු. ශත |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 1000.00 |
| එක් විෂයයකට | 500.00 |
| වාචික පරීක්ෂණයට | 300.00 |

විභාග ගාස්තුව, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවීමට කටයුතු කරන්න.

ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

15. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. විභාගය සම්බන්ධ අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

චිත්‍රාංගනි වාගීස්වර
විදේශ කටයුතු ලේකම්

2016 මාර්තු මස 04 වැනි දින
විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත
විදේශ කටයුතු අමාත්‍යාංශය

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳව පරීක්ෂණය - 2015/2016

1st and 2nd Efficiency Bar Examination and Second Language Test for the Officers of the Sri Lanka Foreign Service - 2015/2016

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය [ ]

| | | |
|---|---|---|
| සිංහල | 2 | (කොටුව තුළ අදාළ අංකය සඳහන් කරන්න) |
| දෙමළ | 3 | |
| ඉංග්‍රීසි | 4 | |

01. (සංශෝධන 5.3 අනුව යොදන්න)
02. (සංශෝධන 5.4 අනුව යොදන්න)

(අ) (i) මුලකුරු සමග අගට යෙදෙන නම, (සිංහලෙන්/දෙමළෙන්:.........................

(ii) මුළ'කුරු සමග අගට යෙදෙන නම, (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................
(අගට යෙදෙන නමට පසුව මුල් අකුරු සඳහන් කරන්න)
*උදා* : (Silva A. B.)

(ආ) (i) මුල'කුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/ දෙමළෙන්) :—————.

(ii) මුල'කුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

03. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

04. උපන් දිනය

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

06. ස්ත්‍රී/පුරුෂ භාවය :- [ ]

(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

07.ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වූ දිනයඃ

වර්ෂයඃ [ | | | ] මාසයඃ [ | ] දිනයඃ [ | ]

08. වර්තමාන තනතුර : ................................................

01. (සංශෝධන 5.3 අනුව යොදන්න)

ඉල්ලුම් කරන විභාගය [ ]

(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

| *විභාගය* | *අදාළ අංකය* |
|---|---|
| කාර්යක්ෂමතා කඩඉම 1 | 1 |
| කාර්යක්ෂමතා කඩඉම 2 | 2 |
| දෙවන භාෂාව | 3 |
| විදේශ භාෂාව | 4 |

09. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති අන්දමට ඉල්ලුම්කරන විභාගයට අදාළ විෂයය අංක පැහැදිලිව සඳහන් කළ යුතුය. (අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විෂයන් හැර වෙනත් විෂයයන්වලට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.)

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| i | |
| ii | |
| iii | |
| iv | |
| v | |
| vi | |

10. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විභාගය අංකය, විෂයය, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

විභාග ගාස්තු ගෙවන ලද අංක .................... දරන කුවිතාන්සිය මෙයට අමුණා ඇත.

ගෙවන ලද විභාග ගාස්තුව රු...........................

.........................................,
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

| මුදල් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න. |
|---|

විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්,........................මයා/මිය/මෙනෙවිය, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සනත් සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර :..............

දිනය:..........................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

පරිශිෂ්ටය "අ "

සිංහල

සිංහල පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස්වලින් සමන්විත වේ.

ලිඛිත පරීක්ෂණය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ :

(i) ව්‍යාකරණ;

(ii) සිංහලෙන් ලියන ලද පෙත්සම් හෝ ග්‍රාම සේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරළීම;

(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් ගත් කොටසක් සිංහලයට පෙරළීම.

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ. :

(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු, සිංහල අයකු විසින් වටහාගෙන ලියාගත හැකිවන පරිදි සිංහලෙන් කියවීම;
(ii) සිංහල භාෂාවෙන් ලියන ලද පෙත්සමක් කියවීම;
(iii) කථාව හා භාෂණ පරිවර්තනය.

මෙම පරීක්ෂණයේ අදහස වනුයේ විවිධ සමාජ කණ්ඩායම්වල කථන සිංහල තේරුම් ගැනීමට ද, සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතුවල දී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

දෙමළ

දෙමළ පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස්වලින් සමන්විත වේ.

ලිඛිත පරීක්ෂණය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ :

(i) ව්‍යාකරණ;
(ii) දෙමළ භාෂාවෙන් ලියන ලද පෙත්සම් හෝ ග්‍රාම සේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරළීම;
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් ගත් කොටසක් දෙමළ භාෂාවට පෙරළීම.

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ. :

(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු දෙමළ අයකු විසින් වටහාගෙන ලියාගත හැකිවන පරිදි දෙමළෙන් කියවීම;
(ii) දෙමළ භාෂාවෙන් ලියන ලද පෙත්සමක් කියවීම;
(iii) කථාව හා භාෂණ පරිවර්තනය.

මෙම පරීක්ෂණයේ අදහස වනුයේ විවිධ සමාජ කණ්ඩායම්වල කථන දෙමළ තේරුම් ගැනීමට ද, සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතුවල දී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද, අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

ඉංග්‍රීසි
ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ. :
(i) ව්‍යාකරණ
(ii) අවබෝධය
(iii) සාරාංශ ලිවීම
(iv) වාර්තා හා ලිපි ලිවීම
(v) වාග් මාලාව.

ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් අපේක්ෂකයින්ගේ දැනගැනීම සඳහා පහත දක්වා ඇත.

PART A

(*a*) Fill in the blanks with the correct form of the verb given within brackets:-

During the last war our country ………. 1 (be) a British Colony …………2 (take) a full part in the war effort. Consequently our tea, rubber and coconut ……………………… 3 (ship) to

Britain at very favourable prices and the foreign exchange we ………………. 4 (earn) ……………………… 5 (accumulate) as assets. Again during the Korean war in the early fifties our products …………………. 6 (fetch) good prices and we ……………………….. 7 (not have) any exchange problem. However, political independence ……………………. 8 (not given rise) to any effort to …………………… 9 (build up) our economy we ………………………… 10 (be) a nation of consumers and we …………………… 11 (Squander) our foreign exchange on consumer goods which ………………………… 12 (can produce) locally and incidentally diversified our economy. Over the last decade we ………………. 13 (begin) to feel the pinch when our primary products …………………. 14 (fail) to command good prices in the world market while our requirements of food both rice and subsidiary food stuffs ……………………….. 15 (rise) in price.

(*b*) Fill in the blanks with the correct preposition (where necessary) :

As Assistant Secretary ……………………… 16 charge ………………………….. 17 subjects. It was my duty to convene groups of officers dealing ………………………… 18 different aspects of development work in the Ministry ………19 time to time. They discussed ……………………… 20 various problems that they confronted and which they could not cope ……………………… 21 on their own. We were thus able to share our experience ………………………… 22 each other and make concrete proposals ……………………….. 23 the Secretary every month. He in turn put …………………24 his own plans for discussion ………………………… 25 these meetings.

(*c*) Underline the correct letters given within brackets that would complete the spelling of the following words.

26. Har……………ment (rass/as/ass).
27. Ember…………….(rass/as/ass).
28. Tol…………………. (arreance/earnce/erence)
29. Par………………..arian (liament/limen/liment)
30. Bal…………………..ing (let/lat/lot)
31. Itin……………………. (erary/arary/erarie)
32. Pers…………(everance/everence/ewerence)
33. Bour……………… (geoise/joursie/juwarsy)
34. Prolet……………………….. (ariet/ariat/eriyat)
35. Com………………ate (memorr/emor/memor)

(*d*) In each of the following statements underline the correct word within brackets:-

36. The inventory was checked by the Board of (Survellance/ Survey/Surveyors).
37. At the enquiry I had to be satisfied that accused officer had (contradicted/ contravened/contaminated) the regulations.
38. Every receipt should have a (counterfoil/ counterfeit/ counterpane) for the purpose of audit.
39. There was a possibility that the prosecution had (fabricated/ fumigated/promulgate) the evidence.
40. (Discrete/Discretionary/Discriminatory) power was given to the Head of the Department under the relevant Act.
41. The Police Party had (laid/lied/lain) in ambush until the bribe taker arrived.
42. The entire staff turned upon (facilitate/ infiltrate/felicitate) the watcher on his retirement.
43. In times of national crises we must avoid (luxuriant/ luxurious) habits.
44. Martial music was played over the radio during height of the battle to keep up the (moral/morale/morals) of the people.
45. Candidates are advised to use (Stationary / Stationery) sparingly owning to the acute paper shortage.

(*e*) Underline the correct phrase in the brackets that means the same as the word or phrase underlined in each sentence.

46. In good management the boss should, support his staff in their work (back out/ back up/ back away)
47. The sales and replacement of stock amounted to over Rs. 5,000 (turn out/ turn up/ turn away).
48. We were warned at the start not to let out work get into arrears (set out/outset)
49. They younger son wasted his father's wealth in a few years. (ran over/ran through)
50. I wanted to see the film, but the queue deterred me from going (put away/put off).

## Part B

Read the following passage carefully and then answer the questions set out below:

Most modern political ideals such, for example, as justice, liberty, constitutional government, and respect for the law or at least the definitions of them began with the reflection of Greek thinkers upon the institutions of City State. But in the long history of political thought the meaning of such terms has been variously modified and always that meaning has to be understood in the light of the institutions by which the indicates were to be realized and of the society in which those institutions did their work. The Greek City States was so different from the political communities in which modern men live that it requires no small effort of the imagination to picture its social and political life. The Greek Philosophers were thinking of political practices far different from any that have prevailed commonly in modern world, and the whole climate of

opinion in which the work was done was different. Their problems though not without their analogies in the preset, were never identical with modern problems, and the ethical apparatus by which political life was evaluated and criticized varied widely from and that now prevails. In order to understand at all accurately what their theories meant is necessary first to realize at least roughly what kind of institutions they had in view and what citizenship connected, as an effect and as an ideal to the public for whom they wrote. For this purpose the Government of Athens-is especially important, partly because it is the best known, but chiefly because it was an object of special concern to the greatest of Greek Philosophers.

As compared with modern states the ancient City-State was exceedingly small both in area and in population. The numbers were exceedingly uncertain but a figure somewhat in excess of three hundred thousand would be approximately correct. Such an arrangement of a small territory dominated by a single City was typical off the City State.

In each of the following cases, choose the alternative which in your opinion supports the views expressed in the above passage. Place a tick (right mark) against the correct answer –

51. Athens in significant for the students of Greek political thought mainly because –
(*a*) it was the most powerful of the Greek City States;
(*b*) it's ideals had been carefully studied by the Greeks themselves;
(*c*) it had the most ideal form of Government;
(*d*) it is the best known of the Greek City-States.

52. Greek political thought was concerned with problems :-
(*a*) entirely unrelated to;
(*b*) identical with;
(*c*) different from Analogous but to.

53. The moral and religious basis of Greek political idea is :-
(*a*) very similar to modern moral and religious ideas;
(*b*) unknown;
(*c*) very different from modern moral and religious ideas.

54. It is :-
(*a*) easy;
(*b*) not at all easy;
(*c*) impossible.

for a modern man to imagine what life was life was like in a Greek city State.

55. In comparison with the ancient Greek City States are :-
(*a*) very large;
(*b*) very small;
(*c*) about the same size.

56. The population of ancient Greek City States was :
(*a*) much less than 300,000;
(*b*) over 3 million;
(*c*) just over 300,000.

57. The City-State of Athens comparisons
(*a*) a small territory govern by a singly city;
(*b*) a large territory govern by a number of cities;
(*c*) a small territory with village councils;
(*d*) a large territory with a decentralized administration.

58. At different times in the history of the world people :-
(*a*) have thought in basically the same way;
(*b*) have thought in different ways;
(*c*) have contradicted the views of people of the previous generation.

59. Details of political theory are derived from Greek Political thought :-
(*a*) because the Greek City States was very similar to modern states;
(*b*) in spite of Greek City State being very different from modern States;
(*c*) because modern political theorists are students of Greek Philosophy.

60. The meaning of political ideal at a particular moment in European History since the time of the Greeks can be defined only be :-
(*a*) Relating it to its context;
(*b*) Tracing it back to its original meaning among the Greeks;
(*c*) Investigating the meaning of the Greek word for it;
(*d*) Taking into account only those features in it which have persisted throughout its history.

61. Write sentences using each of the following words so as to bring out its meaning clearly:-

Arbitration, emoluments, etiquette, consolidates, hypothetical, retrospective, exigencies, evaluate, review, empower.

EITHER

62. Write a letter to the Head of an Educational Institute in an English speaking country, setting out the following information in an orderly manner;

(i) The equivalence of our examination certificate to the certificate specified in this letter cannot be determined as the examining authorities in Sri Lanka have not been consulted by the institution concerned in that country;

(ii) The G.C.E. (Ordinary Level) Credit Pass has been officially equated with an Ordinary Pass in London G.C.E. (Ordinary Level);

(iii) The receipt of the letter sent to the Commissioner General of Examinations is acknowledged;

(iv) Any further information in this matter may be obtained from the Embassy of the Republic of Sri Lanka in that country.

63. Write a memorandum to the Secretary, Bureau of Standards marking out a case for the adoption of the 24 hours clock in this country stating the advantages of such a measure.

පරිශිෂ්ටය " ආ"

01. පළමුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය

1.1 පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

1.2 මතු සඳහන් විෂයය යටතේ විභාගය පවත්වනු ලැබේ.

1 වැනි කොටස

(i) මුදල් - පහත කරුණු ආවරණය වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (x වැනි පරිච්ඡේදය හැර),

(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුව,

උදා: ඒවා සකස් කිරීම, ශීර්ෂ, මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්.

(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කර ගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත්.

(ii) ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය

II වැනි කොටස- විශේෂ ප්‍රශ්න පත්‍ර:

(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය,
(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය,
(iii) ජාත්‍යන්තර කටයුතු,
(iv) ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි සහ පරිගණක හැකියාව.

1.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

1.4 නිලධාරියෙකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත්වූවකු ලෙස සලකනු ලැබේ.

02 . දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2.1 දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

2.2 මතු සඳහන් විෂයය යටතේ විභාගය පවත්වනු ලැබේ.

1 වැනි කොටස

(i) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය,

(ii) පරිපාලනය- පහත කරුණු ආවරණය වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.
(අ) කාර්යාල ක්‍රම සහ සංවිධාන ක්‍රම,
(ආ) ආයතන සංග්‍රහය I වෙළුම සහ II වෙළුම.

II වැනි කොටස- විශේෂ ප්‍රශ්න පත්‍ර:

(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය,
(v) රාජ්‍යතාන්ත්‍රික පරිචය,
(vi) ජාත්‍යන්තර කටයුතු,

2.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

2.4 නිලධාරියෙකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත් වූවකු ලෙස සලකනු ලැබේ.

*සටහන* :

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යටතේ ප්‍රධාන වශයෙන් ප්‍රශ්න නියම කරනු ලබන්නේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ විකාශය අළලාය. ද්විපාර්ශ්වික මෙන්ම බහුපාර්ශ්වික දෙගුණයේම අන්තර් රාජ්‍ය සම්බන්ධතා එකිනෙකට අදාළව රාජ්‍යතාන්ත්‍රික නීතිය සහ ගිවිසුම් නීතිය යන ක්ෂේත්‍රය අළලා ජාත්‍යන්තර නීතිය යටතේ ප්‍රශ්න නියම කරනු ලැබේ.

(ii) නීතිඥවරයෙකු වන්නා වූ හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීති උපාධියක් ලබා ඇත්තා වූ හෝ නිලධාරියකු විභාගයට අදාළ විෂයය වලින් සාමාර්ථයය ලබා ඇත්නම්, ඔහු/ඇය මූලික ආණ්ඩුක්‍රම නීතිය හා ජාත්‍යන්තර නීතිය යන ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කරනු ලබනවා ඇත.

03. විදේශ භාෂා :

3.1. විදේශ භාෂා

| | |
|---|---|
| (i) අරාබි | (vi) චීන |
| (ii) ප්‍රංශ | (vii) ජර්මන් |
| (iii) රුසියානු | (viii) ජපන් |
| (iv) ස්පාඤ්ඤ | (ix) ඉංග්‍රීසි |
| (v) හින්දි | (x) කොරියානු |

3.2 ඉහත එක් එක් ලිඛිත ප්‍රශ්න පත්‍රය පැය දෙකක කාලසීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය යටතේ 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

*සැ.යු.* : ඉහත විදේශ භාෂා පිළිබඳ විෂයය නිර්දේශය මෙම *ගැසට්* නිවේදනයේ ඉංග්‍රීසි කොටසේ පළ කර ඇත.

03-245

## සංශෝධනයයි

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 පන්තියට බඳවා ගැනීම සඳහා, 2016.01.01 වැනි දින අංක 1948 *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විභාග නිවේදන සඳහා පහත සංශෝධන කරනු ලැබේ.**

සේවා පළපුරුද්ද හා කුසලතා පදනම, සීමිත හා විවෘත තරග විභාග වලට අදාළ පොදු සංශෝධන පහත පරිදි වේ.

* පෙර සේවා ව්‍යවස්ථාව යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 පන්තියට බඳවා ගැනීමේ සේවා පළපුරුද්ද හා කුසලතා පදනම, සීමිත හා විවෘත තරග විභාග සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.

* උපාධිය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් ලබා තිබිය යුතුය.

* අනෙකුත් සියලු සුදුසුකම් 2016.02.01 වැනි දිනට සම්පූර්ණ කළ යුතු ය.

* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2016.04.11 වේ.

* 2016.02.01 වැනි දින හෝ ඊට පෙර අයදුම්පත් යොමු කරන ලද අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

ඉහත සංශෝධනයන්ට අමතරව සේවා පළපුරුද්ද හා කුසලතා පදනම, සීමිත හා විවෘත තරග විභාග සඳහා පහත සඳහන් සංශෝධනයන් ද අදාළ වේ.

**සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2015 (2016)**

06. *වයස් සීමාව* :—

2016.02.01 වැනි දිනට වයස අවුරුදු 58 ට නොවැඩි විය යුතු ය.

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)**

01. (ආ) යටතේ ඇති වගුවට ඉහළින් සඳහන් වගන්තිය ඉවත් කරනු ලැබේ.
(ස්ථානගත කිරීමට අදාළ)

02. (ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා)

06. වයස් සීමාව :—

2016.02.01 වැනි දිනට වයස අවුරුදු 52 ට නොවැඩි විය යුතු ය.

09. (iii) (ආ) යටතේ දැක්වෙන වගුවේ 15 තාක්ෂණය විෂයය හැර අනෙකුත් විෂයයන් යටතේ සඳහන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම් තීරුවේ බඳවා ගැනීමට අදාළ සුදුසුකම් අතර ''හෝ'' යන්න ඇතුළත් කරනු ලැබේ.

09. (iii) (ආ) යටතේ දැක්වෙන වගුවේ 14 සෞන්දර්ය විෂයය යටතේ සඳහන් බටහිර සංගීතය සහ නාට්‍ය හා රංග කලාව යන විෂයයන්ද, 15 තාක්ෂණය විෂයයෙන් ජෛව පද්ධති තාක්ෂණය විෂයය හා ඊට අදළ සුදුසුකම ඉවත් කරනු ලැබේ.

සීමිත තරග විභාගයට අදළ ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 12 වගන්තිය හා ඒ යටතේ සඳහන් වගුව ඉවත් කරනු ලැබේ.

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (2016)**

*ගැසට් නිවේදනයේ* ආරම්භක ඡේදයේ සඳහන් ''පහත සඳහන් සුදුසුකම් ලත් නිලධාරින්ගෙන්'' යන්න ''පහත සඳහන් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන්'' යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

01. (ආ) හි දැක්වෙන වගුවට ඉහළින් දැක්වෙන වගන්තිය ඉවත් කරනු ලැබේ. (ස්ථානගත කිරීමට අදළ)

02.11 මෙම තනතුර ස්ථිරය.

05. *වයස් සීමාව*—

2016.02.01 වැනි දිනට වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 32ට නොවැඩි විය යුතු ය.

විවෘත තරග විභාගයට අදළ ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 08 වගන්තිය හා ඒ යටතේ සඳහන් වගුව ඉවත් කරනු ලැබේ.

ඩබ්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2016 මාර්තු මස 01 දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03-431

---

## නිවැරදි කිරීමයි

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

**ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2016**

2016.02.12 වැනි දින පළ කරන ලද අංක 1954 දරන *ගැසට් පත්‍රයේ* 02-362 නිවේදනයේ, උපලේඛනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සියඹලාන්ගමුව 8212 (මොණරාගල දිස්ත්‍රික්කය) ලෙස වැරදියට පළවී ඇත. එය,

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සියඹලාණ්ඩුව 8212 (මොණරාගල දිස්ත්‍රික්කය) ලෙස නිවැරදි විය යුතුයි.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

03-449

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.